**I උපලේඛනය**

| සංයෝජිත වර්ගීකරණ ශීර්ෂය I | සංයෝජිත වර්ගීකරණ සංකේතය II | | විස්තරය III | සෙස් බදු ප්‍රමාණය IV |
|---|---|---|---|---|
| **09.02** | | | **තේ, රසකාරක මිශ්‍රකළ හෝ නොකළ.** | |
| | | | | |
| | 0902.40 | - | අනෙකුත් කලු තේ (පැසවූ) සහ අර්ධ වශයෙන් පැසවූ තේ | |
| | | --- | වෙනත් | |
| | 0902.40.91 | ---- | මුලුමනින්ම ශ්‍රී ලාංකීය සම්භවයෙන් යුත් බවට ශ්‍රී ලංකා තේ මණ්ඩලය විසින් සහතික කරන ලද්දා වූ, රසකාරක යෙදූ | කි.ග්‍රෑමයට රු. 10/- හෝ කොළඹ තේ වෙන්දේසියෙහි සාමාන්‍ය තේ මිලෙන් 2.5% යන අගයන්ගෙන් ඉහල අගය |
| | 0902.40.92 | ---- | මුලුමනින්ම ශ්‍රී ලාංකීය සම්භවයෙන් යුත් බවට ශ්‍රී ලංකා තේ මණ්ඩලය විසින් සහතික කරන ලද්දා වූ, වෙනත් | කි.ග්‍රෑමයට රු. 10/- හෝ කොළඹ තේ වෙන්දේසියෙහි සාමාන්‍ය තේ මිලෙන් 2.5% යන අගයන්ගෙන් ඉහල අගය |
| | 0902.40.93 | ---- | වෙනත්, රසකාරක යෙදූ | කි.ග්‍රෑමයට රු. 10/- හෝ කොළඹ තේ වෙන්දේසියෙහි සාමාන්‍ය තේ මිලෙන් 2.5% යන අගයන්ගෙන් ඉහල අගය |
| | 0902.40.99 | ---- | වෙනත් | කි.ග්‍රෑමයට රු. 10/- හෝ කොළඹ තේ වෙන්දේසියෙහි සාමාන්‍ය තේ මිලෙන් 2.5% යන අගයන්ගෙන් ඉහල අගය |

**II උපලේඛනය**

| සංයෝජිත වර්ගීකරණ ශීර්ෂය I | සංයෝජිත වර්ගීකරණ සංකේතය II | | විස්තරය III |
|---|---|---|---|
| 41.07 | | | **ශීර්ෂ 41.14 හි එන සම් හැර, ඉරූ හෝ නොඉරූ, මතුපිට ලෝම නැත්තා වූ, පදම් කිරීමෙන් හෝ වියළීමෙන් පසුව තවදුරටත් පිළියෙල කළා වූ, පාච්මන් ඩ්‍රෙස්ඩ් ලෙදර් ඇතුළත්ව ගවාදී (මීහරකුන් ද ඇතුළත්ව) හෝ අශ්වයන්ගේ හම්** |
| | | | |
| | | - | අනෙකුත් (පැති ඇතුළුව) : |
| | 4107.99 | -- | අනෙකුත් |

## නිවැරදි කිරීමයි

**1979 අංක 40 දරන ශ්‍රී ලංකා අපනයන සංවර්ධන පනත**

14 වැනි වගන්තිය යටතේ නියෝග

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2012.11.08 දිනැති අංක 1783/21 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ උපලේඛනයේ තීරු අංක II යටතේ දක්වා ඇති, පහත උපලේඛන I හි හඳුනා ගත් සංයෝජිත වර්ගීකරණ සංකේතයන්ට අදාළ සෙස් බදු පැනවීම සම්බන්ධ නියෝග, පහත උපලේඛන II හි සඳහන් පරිදි නිවැරදි විය යුතු ය.

**උපලේඛනය I**

| සංයෝජිත වර්ගීකරණ ශීර්ෂය<br>I | සංයෝජිත වර්ගීකරණ සංකේතය<br>II | | විස්තරය<br>III | සෙස් බදු ප්‍රමාණය<br>IV |
|---|---|---|---|---|
| **03.05** | | | **වියලූ, ලුනු දැමූ හෝ ලුණු දියරෙහි දැමූ, මසුන් ; දුම් ගැසීමේ ක්‍රියාවලියේදී හෝ එයට පෙර පිසින ලද හෝ නොලද, දුම්ගැසූ මසුන් ; මනුෂ්‍ය ආහාරයට සුදුසු මසුන්ගේ, පිටි, ඇඹරුම් පිටි සහ ගුලි** | |
| | | | | |
| | 0305.59.30 | --- | මෝර වරල් | කි.ග්‍රෑමයට රු. 20/- |
| | 0305.59.40 | --- | මසුන්ගේ අතුණුබහන් | කි.ග්‍රෑමයට රු. 20/- |
| | 0305.71 | -- | මෝර වරල් | |
| | 0305.72 | -- | මසුන්ගේ හිස වලිග සහ අතුණුබහන් | කි.ග්‍රෑමයට රු. 20/- |
| | | | | |
| **09.08** | | | **සාදික්කා, වසාවාසි සහ කරදමුංගු** | |
| | | | | |
| | 0908.11 | -- | කුඩුනොකල හා නොඇඹරූ | 10% |
| | | | | |
| **39.20** | | | **ආස්තරනය නොකලා වූ, ආධාර නොකලා වූ හෝ ඒ හා සමානව අනෙකුත් ද්‍රව්‍ය සමග සංයුක්ත නොකලා වූ සවිවර නොවූ සහ ශක්තිමත් නොකලා වූ ප්ලාස්ටික් වලින් නිමකල අනෙකුත් තැටිතහඩු පටල කොල සහ තීරු** | |
| | | | | |
| | | - | අනෙකුත් ප්ලාස්ටික් වර්ගවල : | 15% |
| | | | | |
| **39.26** | | | **ප්ලාස්ටික් වලින් නිමකල වෙනත් භාණ්ඩ සහ 3901 සිට 3914 දක්වා ඇති ශීර්ෂයන් යටතේ ගැනෙන වෙනත් ද්‍රව්‍යයගෙන් නිමකල භාණ්ඩ** | |
| | | | | |
| | 3926.90.60 | --- | දත් බුරුසු සඳහා මිටි | 15% හෝ කි.ග්‍රෑමයට රු.150 |

**II උපලේඛනය**

| සංයෝජිත වර්ගීකරණ ශීර්ෂය<br>I | සංයෝජිත වර්ගීකරණ සංකේතය<br>II | | විස්තරය<br>III | සෙස් බදු ප්‍රමාණය<br>IV |
|---|---|---|---|---|
| **03.05** | | | **වියලූ, ලුනු දැමූ හෝ ලුණු දියරෙහි දැමූ, මසුන් ; දුම් ගැසීමේ ක්‍රියාවලියේදී හෝ එයට පෙර පිසින ලද හෝ නොලද, දුම්ගැසූ මසුන් ; මනුෂ්‍ය ආහාරයට සුදුසු මසුන්ගේ, පිටි, ඇඹරුම් පිටි සහ ගුලි** | |
| | | | | |
| | 0305.71 | -- | මෝර වරල් | කි.ග්‍රෑමයට රු. 20/- |
| | 0305.72 | -- | මසුන්ගේ හිස වලිග සහ අතුණුබහන් | |
| | | | | |
| **09.08** | | | **සාදික්කා, වසාවාසි සහ කරදමුංගු** | |
| | | | | |
| | 0908.11 | -- | කුඩුනොකල හා නොඇඹරූ | |
| | | | | |
| **39.20** | | | **ආස්තරනය නොකලා වූ ආධාර නොකලා වූ හෝ ඒ හා සමානව අනෙකුත් ද්‍රව්‍ය සමග සංයුක්ත නොකලා වූ සවිවර නොවූ සහ ශක්තිමත් නොකලා වූ ප්ලාස්ටික් වලින් නිමකල අනෙකුත් තැටිතහඩු පටල කොල සහ තීරු** | |
| | | | | |
| | | - | අනෙකුත් ප්ලාස්ටික් වර්ගවල : | |
| | | | | |
| **39.26** | | | **ප්ලාස්ටික් වලින් නිමකල වෙනත් භාණ්ඩ සහ 39.01 සිට 39.14 දක්වා ඇති ශීර්ෂයන් යටතේ ගැනෙන වෙනත් ද්‍රව්‍යයයන්ගෙන් නිමකල භාණ්ඩ** | |
| | | | | |
| | 3926.90.60 | --- | දත් බුරුසු සඳහා මිටි | 30% හෝ කි.ග්‍රෑමයට රු.150 |

රිෂාඩ් බදියුදීන්,
කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍ය.

2012 නොවැම්බර් මස 08 වැනි දින,
කොළඹ,
කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශයේ දී ය.

02 - 282

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.